# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 39 දරන
# රබර් පර්යේෂණ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 ඔක්තෝබර් මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 ඔක්තෝබර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1987 අංක 39 දරන රබර් පර්යේෂණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 ඔක්තෝබර් මස 23 වන දින.]

එල්.ඩී.—ඕ. 13/87

**රබර් පර්යේෂණ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1987 අංක 39 දරන රබර් පර්යේෂණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන රබර් පර්යේෂණ ආඥාපනතේ 3 වන වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ:— [illegible] වන අධිකාරයේ 3 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

"මණ්ඩලයේ සංයුතිය සහ කාර්ය පටිපාටිය.

3. (1) මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන් ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවර යාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස තත් කාලයේ ධුරය දරන තැනැත්තා හෝ එම අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ යම් ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස තත් කාල යේ ධුරය දරන තැනැත්තා හෝ එම අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ යම් ජ්‍යෙෂ්ඨ නිලධර යෙක්;

(ඇ) 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සභා පතිවරයා ලෙස තත් කාලයේ ධුරය දරන තැනැත්තා හෝ ඔහුගේ නාමිතයා;

(ඈ) 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි කර්මාන්ත සංස් ථාවේ සභාපතිවරයා ලෙස තත් කාලයේ ධුරය දරන තැනැත්තා හෝ ඔහුගේ නාමිතයා;

(ඉ) රබර් පාලකවරයා ලෙස තත් කාලයේ ධුරය දරන තැනැත්තා;

(ඊ) රබර් පර්යේෂණ ආයතනය පිහිටුවා ඇත්තේ යම් මැතිවරණ දිස්ත්‍රික්කයක් ඇතුළත ද, එම මැතිවරණ දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ; සහ

(උ) රබර් වැවීම, නිෂ්පාදනය කිරීම, විකිණීම හා අපනයනය කිරීම සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලකින් යුතුව, රබර් කර්මාන්තය පිළිබඳ දැනීම හා පළපුරුද්ද ඇති තැනැත්තන් අතුරින්, (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නා වූ සාමාජිකයන් පස් දෙනෙක්.

(2) මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයකු, මරණය, ඉල්ලා අස්වීම, ඉවත් කිරීම හෝ වෙනත් හේතුවක් නිසා තම ධුරය කලින් හිස් කරන්නේ නම් මිස, තම පත්වීමේ දින සිට අවුරුදු හතරක කාලයක් ධුරය දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරන ලද්දේ නම් මිස, නැවත පත් කරනු ලැබීමට ඔහුට හිමිකම් ඇත්තේ ය.

(3) රෝගාතුරවීම, අබලතාව හෝ ශ්‍රී ලංකාවෙන් කාලයක් බැහැරව සිටීම හේතු කොට ගෙන මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුට ස්වකීය කාර්ය ඉටු කිරීමට තාවකාලික වශයෙන් නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තියේ (උ) ඡේදයේ විධිවිධාන කෙරෙහි සැලකිල්ලක් දක්වමින්, එම කාලය තුළ, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(4) තම ධුරයෙන් අස්වන බවට අමාත්‍යවරයා ආමන්ත්‍රිත ලිපියක් මඟින් මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුට කවර වූ හෝ අවස්ථාවක අස් විය හැකි අතර, අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් එම අස්වීම පිළිගනු ලැබීම මත එය ක්‍රියාත්මක වන්නේ ය.

(5) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මඟින්, මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු යම් හේතුවක් නොදක්වා හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. මෙම උපවගන්තිය යටතේ නියෝගයක් කරනු ලබන්නේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද, ඒ නියෝගය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින එම සාමාජිකයා ධුරය අත්හළ සේ සලකනු ලැබිය යුතු ය.

(6) මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම, නැතහොත් වෙනත් හේතුවක් නිසා, මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු විසින් ධුරය අත්හරිනු ලැබූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තියේ (උ) ඡේදයේ විධිවිධාන කෙරෙහි සැලකිල්ලක් දක්වමින් එම සාමාජිකයා වෙනුවෙන් අනුප්‍රාප්තවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එවැනි පත් කළ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තකු, තමා අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවෙන් ද, එම සාමාජිකයාගේ ඉකුත් නොවූ ධුර කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(7) අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා නියම කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක් මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවිය හැකි ය.

(8) මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් හෝ එහි යම් සාමාජිකයකුගේ පත්වීමේ සම්බන්ධයෙන් වූ යම් දෝෂයක් පැවතීම පමණක් හේතුකොට ගෙන එම මණ්ඩලයේ කවර වූ හෝ ක්‍රියාවක්, තීරණයක් හෝ කාර්ය පටිපාටියක් නිර්බල වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

(9) මණ්ඩලයේ සාමාන්‍ය අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණි මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු, සිය ධුරය අත්හළ සේ සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මණ්ඩලය විසින් ස්වකීය අභිමතය පරිදි, පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් සාමාජිකයකු පත් කිරීමට පෙර, ඔහුගේ ධුරයෙහි ඔහු පුනස්ථාපනය කරනු ලැබිය හැකි ය.

(10) මෙම ආඥාපනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට මණ්ඩලයේ කාර්ය පටිපාටිය පවත්වාගෙන යා යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 3අ අලුත් වගන්තිය ඇතුළු කිරීම.

3. පහත සඳහන් අලුත් වගන්තිය, 3 වන වගන්තියට ඉක්බිතිව මෙයින් ඇතුළු කරන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 3අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

“මණ්ඩලයේ සභාපතිවරයා සහ උප සභාපතිවරයා.

3අ. (1) අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු, පිළිවෙලින් මණ්ඩලයේ සභාපතිවරයා සහ උප සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය හැකි ය.

(2) (3) වන හා (5) වන උපවගන්තිවල විධිවිධානයන්ට යටත්ව, සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ ධූර කාලය, ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාලය විය යුතු ය :

එසේ වුව ද, මණ්ඩලයේ සාමාජිකයකු ලෙස වූ ධූර කාලය ඉකුත් වීමට පෙර, සභාපතිවරයා හෝ උප සභාපතිවරයා ලෙස ධූරය දැරීම සභාපතිවරයා හෝ උප සභාපතිවරයා අවසන් කරනු ලබන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා හෝ උප සභාපතිවරයා ලෙස මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි අතර, එම සාමාජිකයා විසින්, ඔහු සභාපතිවරයා හෝ උප සභාපතිවරයා ලෙස කලින් ධූරය අත් හරින්නේ නම් මිස, තමා අනුප්‍රාප්ත වන්නේ යම් සභාපතිවරයකු හෝ උප සභාපතිවරයකු සඳහා ද, එම සභාපතිවරයාගේ හෝ උප සභාපතිවරයාගේ ඉකුත් නොවූ ධූර කාලය සඳහා සභාපතිවරයා හෝ උප සභාපතිවරයා ලෙස සේවය කරනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නො දක්වා හෝ සභාපතිවරයාගේ පත්වීම අවසන් කරනු ලැබිය හැකි ය.

(4) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා සභාපතිවරයාට ස්වකීය ධූරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලික වශයෙන් නොහැකි වුවහොත්, අමාත්‍යවරයා විසින්, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම, වැඩ බැලීම සඳහා, මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(5) අමාත්‍යවරයා ආමන්ත්‍රිත තම අත්සන සහිත ලියවිල්ලක් මගින්, සභාපතිවරයාට කවර වූ හෝ අවස්ථාවක, සභාපති ධූරයෙන් අස්විය හැකි ය. අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් එම අස්වීම පිළිගනු ලැබීම මත එය ක්‍රියාත්මක වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ "3 (6) වන වගන්තිය යටතේ සාදනු ලබන සියලුම නියෝග සහ 4 (12) වන වගන්තිය යටතේ සාදනු ලබන සියලුම රීති" යන වචන හා ඉලක්කම් වෙනුවට "4 (12) වන වගන්තිය යටතේ සාදනු ලැබූ සියලුම රීති" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ 9 වන, 10 වන හා 11 වන විෂයාංක ඉවත් කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ කුමක් සඳහන් වුව ද, මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දින මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ධුරය දරන්නා වූ සෑම තැනැත්තකු ම, ඒ තැනැත්තා ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන අනුව එම ධුරය දරන්නේ වුව ද, නැතහොත් 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන අනුව එම ධුරයට නම් කරන ලද්දේ වුව ද, මේ පනත ආරම්භ වන දින ධුරය දැරීම අවසාන විය යුතු ය.

මේ පනත ආරම්භ වන දිනට පෙරාතුවම වූ දින ධුරය දරන්නා වූ මණ්ඩලයේ සාමාජිකයන්, මේ පනත ආරම්භ වන දින එම ධුරය දැරීම අවසාන විය යුතු බව.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දට ප්‍රථම දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.